# Abstract No 55

## පාලි මිලින්දපඤ්හො කෘතියට පදනම් වූ මූලාශ්‍රයෙහි භාෂා මාධ්‍යය සම්බන්ධයෙන් ඉදිරිපත් ව ඇති මතවාද පිළිබඳ විමසුමක්.

**එම්. බී. බී. ජයසුන්දර**
කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.
buddhisinh@gmail.com

මිලිඳු - නාගසේන ඓතිහාසික සංවාදය පාලි බසින් වාර්තා කරන ‘මිලින්දපඤ්හො’ නම් කෘතිය පෙර’පර දෙදිග වියතුන්ගේ සම්භාවනාවට පාත්‍ර වූ බෞද්ධ ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයකි. එය ක්‍රි. පූ. 150ත් ක්‍රි. ව. 45ත් අතරකාලයේ දී රචනා වූ භාරතීය මූලාශ්‍රයක පශ්චාත්කාලීන සංවර්ධනයක් ලෙස සැලකෙන අතර එකී මූලාශ්‍රයක වර භාෂා මාධ්‍යයකින් රචනා වූයේ ද යන කරුණ මතභේදාත්මක ය. බහුතර පෙර’පර දෙදිග වියතුන්ගේ අදහස වන්නේ එය සංස්කෘත භාෂාවෙන් රචනා වූ බවයි. විද්‍යමාන පාලි කෘතියේ ඇතුළත් සර්වාස්තිවාදී බෞද්ධ අදහස් හා රචනා ශෛලියෙන් ප්‍රතීත සංස්කෘත භාෂා ලක්ෂණ යන සාදක ඔවුහු ඒ සඳහා පාදක කර ගනිති. ඒ මතය නොපිළිගන්නා තවත් පිරිසක් මූලාශ්‍රය ප්‍රාකෘත භාෂාවෙන් හෝ පාලි භාෂාවෙන් හෝ රචනා වූ බව පවසති. ඇතැම් දේශීය වියතුන්ගේ අදහස පරිදි මිලිඳු - නාගසේන සංවාදය වයඹ දිග ඉන්දියාවේ ථෙරවාද හා සර්වාස්තිවාද බෞද්ධ දෙපිරිස අතර ඇති වූ සංවාදයක් වන බැවින් ථෙරවාදීන් පාලියෙන් ද සර්වාස්තිවාදීන් සංස්කෘතයෙන් ද වාර්තා කර තිබේ. පැරණි මූලාශ්‍රය විද්‍යමාන නොවන බැවින් මේ සියලු මතවාද ගොඩනැඟී ඇත්තේ පාලි මිලින්දපඤ්හො කෘතිය හා නාගසේන භික්ෂුසූත්‍ර යන චීන පරිවර්තන ග්‍රන්ථය පාදක කරගෙන ය. එකී මතවාද පිළිබඳ සාවධාන ව ඒවායෙහි තර්කානුකූල බව විමසමින් පාලි මිලින්දපඤ්හො කෘතියට පාදක වූ මූලාශ්‍රයෙහි භාෂා මාධ්‍යය හඳුනා ගැනීම මේ පර්යේෂණයෙහි අරමුණ විය. ඒ අනුව, මිලිඳු - නාගසේන සංවාදය වාර්තා කළ පැරණි ම මූලාශ්‍රය රචනා වූයේ සංස්කෘත භාෂාවෙන් ද නැතහොත් පාලි භාෂාවෙන් ද යන පර්යේෂණ ගැටලුව කේන්ද්‍ර කරගෙන මේ අධ්‍යයනය සිදු විය. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ආශ්‍රයෙන් සිදුකරන ලද සාහිත්‍යමය දත්ත විශ්ලේෂණයක් මෙහි පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් භාවිත කෙරිණි. ඉදිරිපත් ව ඇති මතවාද සමාලෝචනයෙන් හා මූලාශ්‍රයාගත සාදක විශ්ලේෂණයෙන් පසුව, පාලි මිලින්දපඤ්හයට පාදක වූ මූලාශ්‍රය පාලි භාෂාවෙන් රචනා වූයේ ය යන මතය බොහෝ දුරට පිළිගත හැකි බව අනාවරණය විය.

**ප්‍රමුඛපද:** මිලින්දපඤ්හො, සංස්කෘත, පාලි, ථෙරවාදය, සර්වාස්තිවාදය